දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011
) 0112698507 , 0112694033
) 0112675449 , 0112675280

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866
) 0112693869
) 0112692913

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) NCD/78/2020

ඔබේ අංකය / உமது இல / Your No. )

දිනය / திகதி / Date ) 23.09.2020

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක: **01/39/2020**

සියලුම ප්‍රධාන පළාත් ලේකම්වරුන්/ පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල්, පළාත් මහ රෝහල් , දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන් සහ
ආයතන ප්‍රධානීන්.

**ජාතික විෂ නිවාරණ සතිය - 2020 ඔක්තෝබර් 19 – 25 දක්වා**

**"විෂ සහිත සත්ත්ව දෂ්ටන සහ ප්‍රථමාධාර "**

ජාතික විෂ නිවාරණ සතිය, ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව, පසුගිය වසර කිහිපය මුළුල්ලේ වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලක් වේ. අනතුරු වැළැක්වීමේ ජාතික කමිටුව මගින් 2007 වර්ෂයේ ගත් තීරණයක් අනුව මෙම වැඩසටහන ආරම්භ විය. එමගින් විවිධ විෂ වීම් වැළැක්වීම හා ප්‍රතිකාරයන් පිළිබඳව මහජනතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් දැනුවත් කරනු ලබයි

ජාතික සෞඛ්‍ය සංඛ්‍යා ලේඛණවලට අනුව විෂ සහිත සත්ත්ව දෂ්ටන අතරින් අද වන විට වැඩිම රෝගීන් සංඛ්‍යාවක් රෝහල් ගත වනුයේ සර්ප දෂ්ටන හේතුවෙනි.

මීට අමතරව විෂ සහිත සන්ධිපාදක දෂ්ටන ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි පාරිසරික උවදුරකි. මෙම දෂ්ටන අතරට මී මැස්සන්, බඹරුන්, දෙබරුන්, ගෝනුස්සන්, පත්තෑයන්, දිවි මකුළුවන් අයත් වේ. බහුල වශයෙන් මෙම දෂ්ටන වාර්තා වනුයේ නුවරඑළිය, මහනුවර, පොළොන්නරුව, වව්නියාව හා අනුරාධපුර දිස්ත්‍රික්ක වලිනි. මෑතකදී සුදු ගෝනුසු (*Hottentotta tumulus*) දෂ්ටන නිසා යාපනය අර්ධද්වීපයෙන් කැපී පෙනෙන මරණ සංඛ්‍යාවක් වාර්තා විය. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ විෂ සහිත සත්ත්ව දෂ්ටනවල නිවැරදි දත්ත හා සංඛ්‍යා ලේඛන සීමිතය.

තවද ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ආශ්‍රිතව යාපනය, පුත්තලම, ගාල්ල සහ කොළඹ දිස්ත්‍රික්ක වලින් විෂ සහිත මුහුදු ජීවී දෂ්ටනද වාර්තා වේ.

ඒ අනුව දිවයින තුල විෂ සහිත දෂ්ටන හේතුකොටගෙන සිදුවන රෝහල්ගත වීම් හා මරණ අවම කර ගැනීම උදෙසා මෙම වර්ෂයේදී විෂ නිවාරණ සතිය සඳහා පහත සඳහන් තේමාව ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් තෝරා ගෙන ඇත.

ජාතික විෂ නිවාරණ සතිය තුල ජනතාව නිසිපරිදි දැනුවත් කිරීම සෞඛ්‍ය සේවා ආයතන පද්ධතින් හරහා සිදු කිරීම මෙකී චක්‍රලේඛය නිකුත් කිරීමේ අභිප්‍රාය වෙයි.

**තේමාව** - **"විෂ සහිත සත්ත්ව දෂ්ටන සහ ප්‍රථමාධාර "**

නියමිත කාළ වකවානුව - **2020 ඔක්තෝබර් 19-25**

**අරමුණු**

1. විෂ සහිත සත්ත්ව දෂ්ටන හේතුවෙන් රෝහල් ගතවන හා මියයන සංඛ්‍යාව අවම කර ගැනී
2. සත්ත්ව දෂ්ටන අවම කර ගැනීමේ ක්‍රම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

**යෝජිත කාර්යයන් -**

කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට ක්‍රියාකාරි වැඩපිළිවෙලක් ආයතනය තුල සංවිධානය කිරීම.

01. දේශන සහ ප්‍රදර්ශන පැවැත්වීම
02. අත්පත්‍රිකා හා පෝස්ටර් බෙදා හැරීම

මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්ථාපිත ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් උපදෙස් හා මාර්ගෝපදේශන ලබා ගත හැකි අතර වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 011-2686143, 011-691111- දිගු අංක 2430 ඔස්සේ එම මධ්‍යස්ථානය හා සම්බන්ධ විය හැක.

මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළුදෙනාටම දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටින අතර එකී ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමි. මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෑම ආයතනයක් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ඔබ සේවා ස්ථානයේ සහ ප්‍රජාව තුල ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව 2020 නොවැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ බෝනොවන රෝග වෙත ඉදිරිපත් කළ යුතුය.

**වෛද්‍ය එස්. එච්. මුණසිංහ**
**ලේකම්**
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය එස්.එච්.මුණසිංහ
**ලේකම්**
සෞඛ්‍ය අමාත්‍යාංශය